පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

තෙවන වාර පරීක්ෂණය - 2017

විෂයය - ගෘහ ආර්ථික විද්‍යාව I

පාසලේ නම : ....
ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ....
....

කාලය : පැය 02 යි.

- **වඩාත් නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. ගෘහ නිර්මාණයේදී අවට පරිසරයේ දර්ශණීය සෞන්දර්යාත්මක බව, වාතාශ්‍රය සහ ආලෝකය නිවැසියන්ට ලැබෙන ලෙස සැලසුම් කිරීම ගෘහ නිර්මාණ ශිල්පය වන්නේය. ඒ සඳහා අනුගමනය කලයුතු මූලධර්ම වන්නේ,
    (i) නම්‍යතාවය හා රාශීකරණයයි (ii) ආරක්ෂාව හා පිහිටි අත
    (iii) සංසරණය හා වාතාශ්‍රය (iv) පිහිටි අත හා සංසරණය
    (v) පිහිටි අත හා වාතාශ්‍රය

02. වර්ණයක අගය වෙනස් කිරීමට උපයෝගී කරගත හැකි වර්ණ පහත දැක්වෙන වර්ණ අතරින් තෝරන්න.
    (i) රතු සහ නිල් (ii) කළු සහ සුදු (iii) කහ සහ කොළ
    (iv) කහ සහ දම් (v) රතු සහ කොළ

03. කලා මූලිකාංග අයත් කාණ්ඩය වනුයේ,
    (i) රිද්මය හා රේඛා (ii) වර්ණය හා හැඩය (iii) තුලනය හා සමානුපාතය
    (iv) වර්ණය හා තුලනය (v) හැඩය හා පුනරුත්තිය

04. සුජාතා තම නිවසේ විසිත්ත කාමරය වර්ණ ගැන්වීම සඳහා විරුද්ධ වර්ණ ගැලපුම තෝරා ගන්නා ලදී. ඇය විසින් තෝරා ගතයුතු විරුද්ධ වර්ණ ඇතුලත් කාණ්ඩය වනුයේ,
    (i) නිල්, කහ (ii) කහ, රතු (iii) දම් සහ රතු දම්
    (iv) කොළ, කහ කොළ (v) නිල් හා තැඹිලි

05. උසින් අඩු කාමරයක උස් බව වැඩි කර ගැනීමට වර්ණ භාවිතයෙන් ගතහැකි ක්‍රියාමර්ගය වනුයේ,
    (i) ජනෙල් සඳහා ලා වර්ණ යෙදීම (ii) ලා වර්ණයෙන් යුතු උපාංග භාවිතය
    (iii) යාබද බිත්ති වලට ලා වර්ණ යෙදීම (iv) සිවිලිම සඳහා ලා වර්ණ යෙදීම
    (v) පෞරාණික භාණ්ඩ යොදා ගැනීම

06. රේඛා මගින් විවිධ හැඟීම් මතු කරයි. තිරස් රේඛා මගින් මතුවන හැඟීම් වනුයේ,
    (i) උස් බව, දැඩි බව හා කැපී පෙනීම
    (ii) ප්‍රමාණය කුඩා කර පෙන්වයි, ඇත් කර පෙන්වයි
    (iii) පුලුල් බව, ශාන්ත බව, මිටිබව පෙන්වයි
    (iv) ක්‍රියාශීලී බව හා කලහකාරී බව පෙන්වයි
    (v) සිසිල් බව හා ප්‍රමාණය විශාල කර පෙන්වීම සිදු කරයි

07. කිසියම් ස්ථානයක එක් භාණ්ඩයක් හෝ උපාංගයකට ඇස ආකර්ශනය වීමට සැලැස්වීම හඳුන්වනුයේ,
    (i) තුලනයයි (ii) රිද්මයයි (iii) සමානුපාතයයි
    (iv) එකගත්වයයි (v) අවධාරණයයි

Education NCP - www.edncp.lk

08. කුඩා බව සිට විශාල බව දක්වාද විශාල බව සිට කුඩා බව දක්වාද ක්‍රමානුකූලව භාණ්ඩ හෝ උපකරණ යොදා ගැනීම හඳුන්වන රිද්ම රටාව වන්නේ,

(i) සංක්‍රමනය තුලින් රිද්මයයි (ii) අනුක්‍රමනය තුලින් රිද්මයයි

(iii) ප්‍රතියෝගය තුලින් රිද්මයයි (iv) පුනරුක්තිය තුලින් රිද්මයයි

(v) විකිරණ තුලින් රිද්මයයි

09. ජල සැපයුම් පද්ධතියක ජලය ගලායාම පාලනය කිරීමට යොදා ගන්නේ,

(i) පා කපාටයයි (ii) බෝල කපාටයයි (iii) නැවතුම් කපාටයයි

(iv) දොරටු කපාටයයි (v) ගුලාකපාටයයි

10. කසල වර්ග කරන බැග් සඳහා යෝජිත තැඹිලි වර්ණ කේතයෙන් දක්වෙනුයේ,

(i) කාබනික අපද්‍රව්‍ය (ii) ප්ලාස්ටික් හා පොලිතීන් සඳහා

(iii) කඩදාසි සඳහා (iv) වීදුරු/ බෝතල් (v) ලෝහ/ පොල්කටු

11. පොලිතීන් පිළිස්සීමේදී පිටවන ඉතාමත් විෂ සහිත වායුව වනුයේ,

(i) කාබන්ඩයොක්සයිඩ් (ii) ඇමෝනියා (iii) මීතේන්

(iv) ඩයොක්සීන් (v) කාබන් මොනොක්සයිඩ්

12. මුළුතැන්ගෙයින්, නානාකාමරයෙන්, ළිඳ අසලින් බැහැරවන ද්‍රව අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කරන ක්‍රමය වන්නේ,

(i) ගෙවත්තේ වගා කටයුතු සඳහා යොදා ගැනීම

(ii) කොන්ක්‍රීට් ආවරණයක් යෙදූ වලකට බැහැර කිරීම.

(iii) නගරයේ පොදු ජල ප්‍රවාහන පද්ධතියකට එකතු කිරීම.

(iv) වැලි පිරවූ පෙරණයක් තුලින් යැවීම.

(v) මතුපිටට ගලා යාමට සැලැස්වීම.

13. ජලය ලීටර් 1000 ක් සඳහා ක්ලෝරීන් මිශ්‍රණය යෙදිය හැකි අනුමත ප්‍රමාණය

(i) 5 g කි (ii) 7 g කි (iii) 8 g කි

(iv) 20 g කි (v) 2 g කි

14. නිවසේදී පානය සඳහා ජලය පිරිසිඳු කර ගැනීමේ ක්‍රම අතර ආසවනය කිරීම යනු,

(i) උතුරුවා නිවා පෙරා ගැනීමයි.

(ii) ගෘහ පෙරණ භාවිතයයි.

(iii) ජලය උතුරා වාෂ්ප බවට පත්කර නැවත සිසිල් කර කුඩා ෆිල්ටර් මගින් පෙරීමෙන් පිරිසිඳු කිරීමයි.

(iv) රෙදි කඩකින් පෙරා ගැනීමයි.

(v) ක්ලෝරීන් යෙදූ ජලය කුඩා ෆිල්ටර් මගින් පෙරීමෙන් පිරිසිදු කර ගැනීමයි.

15. හයිඩ්‍රජන් හා ඔක්සිජන් අතර 2 : 1 අතර අනුපාතයට සංයෝග වී ඇත්තේ,

(i) කාබෝහයිඩ්‍රේට වලය (ii) ඇමයිනෝ අම්ල වලය

(iii) මේද අම්ලය වලය (iv) පොලි සැකරයිඩවල පමණි

(v) අසංතෘප්ත මේද අම්ල වලය

16. සුක්රෝස් අණුවක් ජලය විච්ඡේදනය වීමේදී,

(i) ග්ලූකෝස් අණු දෙකක් ලැබේ.

(ii) ෆෲක්ටෝස් අණු දෙකක් ලැබේ.

(iii) ග්ලැක්ටෝස් අණුවක් හා ෆෲක්ටෝස් අණු දෙකක් ලැබේ.

(iv) ග්ලූකෝස් අණුවක් හා ලැක්ටෝස් අණු දෙකක් ලැබේ.

(v) ග්ලූකෝස් අණුවක් හා ෆෲක්ටෝස් අණුවක් ලැබේ.

17. අත්‍යාවශ්‍යය ඇමයිනෝ අම්ල දෙකකි,

Education NCP - www.ednlcp.lk

(i) ග්ලයිසින් හා ලයිසින් (ii) ට්‍රිප්ටොෆෑන් හා ප්‍රෝලයින් (iii) ලයිසින් හා මෙතයොනින්

(iv) ලියුසින් හා ටයිරොසින් (v) වැලයින් හා ග්ලයිසින්

18. මාළුතෙල් වල අඩංගු හිතකර මේද අම්ලයකි,

(i) ඔමේගා 03 මේද අම්ල (ii) ඔමේගා 06 මේද අම්ල (iii) ට්‍රාන්ස් මේද අම්ල

(iv) ඒක අසංතෘප්ත මේද අම්ල (v) සංතෘප්ත මේද අම්ල

19. ලිනොලෙනික් හා ලිනොලෙයින් අම්ලය අත්‍යාවශ්‍ය මේද අම්ල ලෙස හඳුන්වනු ලැබේ. එසේ හැඳින්වීමට හේතු වන කරුණු වන්නේ,

(i) ඒවා අහාර වලින් ලබා ගැනීමට අවශ්‍ය නැති නිසා

(ii) ශරීරය තුල ප්‍රමාණාත්මකව නිපදවන නිසා

(iii) ශරීරය තුල ප්‍රමාණාත්මකව නිපදවන්නේ නැති නිසා

(iv) ශරීරයේ ක්‍රියාවලීවලට අත්‍යාවශ්‍ය නිසා

(v) ඒවා අසංතෘප්ත මේද අම්ල නිසා

20. වැඩිහිටියෙකුගේ ශරීරය තුල නිපදවා ගත හැකි කුඩා දරුවන් සඳහා වැදගත් වන අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ලය වන්නේ,

(i) මෙතයොනින් (ii) ට්‍රිප්ටොෆෑන් (iii) වැලීන්

(iv) ආර්ජනින් (v) ලයිසීන්

21. පහත සඳහන් වරණ වල පෝෂ්‍ය පදාර්ථ වලින් මහා ඛනිජ හා ක්ෂුද්‍රඛනිජ පිළිවෙලින් ඇති වරණය වන්නේ,

(i) කැල්සියම්, පොස්ෆරස්, යකඩ, සින්ක්, අයඩීන්

(ii) කැල්සියම්, යකඩ, පොස්පරස්, සින්ක්, අයඩීන්

(iii) පොස්පරස්, යකඩ, කැල්සියම්, සින්ක්, අයඩීන්

(iv) සල්ෆර්, ක්ලෝරයිඩ්, තඹ, පොස්පරස්, අයඩීන්

(v) පොටෑසියම්, මැග්නීසියම්, සල්ෆර්, මැන්ගනීස්, තඹ

22. සිරුරේ පේශීතානය පාලනය හා සම්බන්ධ ඛනිජය වන්නේ,

(i) සෝඩියම් (ii) අයඩීන් (iii) සින්ක් (iv) කැල්සියම් (v) මැග්නීසියම්

23. බහුලව භාවිතා වන රස හා සුවඳ වැඩිකරන සගන්ධකාරකයකි,

(i) ප්‍රොපිලීන් (ii) පොලි සෝර්බිට්ස් (iii) සෝඩියම් නයිට්‍රේට්

(iv) පොටෑසියම් නයිට්‍රයිට් (iv) මොන සෝඩියම් ග්ලුටමේට්

24. ආහාර සැකසීමේදී ගුණාත්මක ලක්ෂණ ඇතිවීමට හෝ ඒවා වැඩි දියුණු කිරීමට ආකලන භාවිතා කරයි. ඒ අනුව අර්ද්‍රතාවය පාලනය කරන කාරකයකි,

(i) ග්ලිසරෝල්, ග්ලූසිරස්, සෝර්බිටෝල්

(ii) සෝඩියම් නයිට්‍රයිට් සහ පොටෑසියම් නයිට්‍රයිට්

(iii) ඒමයිල් ඇසිටේට් හා ඊතයිල් බියුටිරේට්

(iv) පොප්‍රිලින් පොලිසෝබේට්

(v) කාබනික බීම, ජෙලටීන්, ග්ලූසිරප්

25. පෝෂණ පදාර්ථ පිළිබඳ කරනු ලබන පැවරුමකදී පහත සඳහන් කරුණු කිහිපයක් යොදා ගන්නා ලදි,

A. හඳුනාගැනීම සඳහා සුඩාන් 3 යොදනු ලැබේ.

B. ස්ටිරියක් අම්ලයේ අඩංගු වේ.

C. කම්පන අවශෝෂකය ලෙස ක්‍රියාකරයි.

මෙම කරුණ හා සම්බන්ධ පෝෂණ පදාර්ථය වන්නේ,

(i) ප්‍රෝටීන (ii) කාබෝහයිඩ්‍රේට් (iii) මේදය

(iv) සංතෘප්ත මේද අම්ල (iv) පොලිසැකරයිඩ

Education NCP - www.edncp.lk

26. ශරීරයේ ඇති ලවන සාන්ද්‍රණය වැඩිවීමෙන් වැලදෙන අහිතකර තත්වය හඳුන්වන්නේ,

(i) ඇසිඩෝසියාව (ii) කිටෝසියාව (iii) ගැස්ට්‍රයිටිස්

(iv) ආම්ලිකතාවය (v) නිරක්තිය

27.



සුමේධ විසින් ගනු ලැබූ උදේ ආහාර වේලෙහි අඩංගු මහා පෝෂක ඉහත තීර ප්‍රස්ථාරයේ අඩංගු වේ. ඒ අනුව ඔහු ලබාගත් කැලරි ප්‍රමාණය වනුයේ,

(i) කි කැලරි 660 (ii) කි කැලරි 570 (iii) කි කැලරි 446

(iv) කි කැලරි 490 (iv) කි කැලරි 486

28. ශරීර ස්කන්ධ දර්ශකය එනම්, BMI අගය මනිනු ලබන්නේ,

(i) ශරීර බර (ග්‍රෑම් වලින්) / ශරීර උස^2 (වර්ග මීටර් වලින්)

(ii) ශරීරයේ උස^2 (මීටර් වලින්) / ශරීර බර (ග්‍රෑම් වලින්)

(iii) ශරීර බර කිලෝ ග්‍රෑම් / ශරීර උස^2 (මීටර් වලින්)

(iv ශරීර උස (මීටර් වලින්) / ශරීර බර (කිලෝ ග්‍රෑම් වලින්)

(v) ශරීර බර (කිලෝ ග්‍රෑම් වලින්) / ශරීර උස^2 (මීටර් වලින්)

29. රෝග කිහිපයක් සඳහා සිසුන් ඉදිරිපත් කල කරුණු පහත දැක්වේ.

A. ආහාර වේල්වල තන්තුමය ආහාර අඩංගු කල යුතුය.

B. ප්‍රධාන ආහාර වේල් තුන වෙනුවට කුඩා ආහාර වේල් කිහිපයක් දිය යුතුය.

C. වකුගඩු වලට පමණක් හානිකර බලපෑම් ඇති කරයි.

D. බර අඩුවීම හා පිපාසය මුලින් ඇතිවන රෝග ලක්‍ෂණ වේ.

E. ආරමය බලපෑමක් ඇති රෝගයකි.

මෙයින් දියවැඩියා රෝගයට අදාළ කරුණු වනුයේ,

(i) A, B, හා C පමණි. (ii) A, B, හා E පමණි. (iii) A, B, හා D පමණි.

(iv) A, B, C හා D පමණි. (v) A, B, D හා E පමණි.

30. පැසීමේ ක්‍රියාවලිය මගින් සාදා ගන්නා පරිපූරක ආහාරයකි.

(i) උප්පුමා (ii) තෝසේ (iii) ආප්ප (iv) යෝගට් (iv) මුං කිරිබත්

Education NCP - www.edncp.lk

31. ආහාර ඇසුරුම් කිරිමේදී භාවිතා කෙරෙන ඇසුරුම් ද්‍රව්‍ය වල ගුණාංග කිහිපයක් පහත දැක්වේ.

A. ප්‍රතිචක්‍රීකරණය කල හැකිය.

B. වායූන්ට ප්‍රතිරෝධීය.

C. විනිවිද පෙනෙයි.

D. රත් වූ විට හැකිලේ.

E. මුද්‍රා තැබීම පහසුයි.

F. තෙල් අඩංගු සගන්ධ සහිත ආහාර සඳහා සුදුසුයි.

මින් ඇලුමිනියම් ඇසුරුම් වලට අදාල වන්නේ,

(i) A, C, D (ii) C, D, F (iii) D, E, F (iv) A, B, E (v) D, E, C

32. ෂෝට්ක්‍රස්ට් පිටි මෝලිය භාවිතයෙන් සාදන ආහාර වර්ග 2 කි.

(i) පැටිස් හා බනිස් (ii) පැටිස් හා අනෝදා මල් (iii) ඉක්ලෙයාස් හා ඉටිලි

(iv) රෝල්ස් හා ලසන්යා (v) ක්‍රීම් බනිස් හා පැටිස්

33. ළමයින් අතර පවතින ත්‍රිව්‍ර මන්ද පෝෂණයේ ලක්ෂණයකි,

(i) අලස බව ඇතිවීම (ii) වර්ධන වේගය අඩු වීම (iii) උසට සරිලන බර අඩුවීම

(iv) සම වියලීයාම (v) වයසට සරිලන උස අඩුවීම

34. ආහාර ද්‍රව්‍ය හා බඳුන් වෙන වෙනම ජීවාණුහරණය කරමින් ක්ෂුද්‍ර ජීවීන්ගෙන් තොර පරිසරයක මුද්‍රා තබමින් කෙරෙන ඇසුරුම් ක්‍රමය හඳුන්වන්නේ,

(i) සක්‍රීය ඇසුරුම් ක්‍රමය (ii) ඔක්සිජන් යොදා ඇසිරීම (iii) අවශෝෂක යොදා ඇසිරීම

(iv) අපුතිකරණයට ඇසිරීම (v) වායු භාවිතා කර ඇසිරීම

35. විසිතුරු මැහුම් ක්‍රම පමණක් ඇතුලත් කාණ්ඩය වන්නේ,

(i) කතිර මැස්ම හා වාට් මැස්ම (ii) බූලියන් මැස්ම හා පිහාටු මැස්ම (iii) ආර මැසීම හා ප්‍රංශ ගැට මැසීම

(iv) සිහින් නූල් දුවවීම හා නැටි මැස්ම (v) දිග කොට මැස්ම හා රේන්ද ඇල්ලීම

36.





ඉහත දක්වා ඇති විසිතුරු මැහුම් ක්‍රම දෙක පිලිවෙලින්,

(i) ලේසි ඩේසි මැස්ම හා හුරුළුකටු මැස්ම වේ.

(ii) ප්‍රංශ ගැට මැස්ම හා පිරවිලි මැස්ම වේ.

(iii) ලේසි ඩේසි මැස්ම හා කතිර මැස්ම වේ.

(iv) බූලියන් මැස්ම හා කතිර මැස්ම වේ.

(v) පිහාටු මැස්ම හා හුරුළු කටු මැස්ම වේ.

37. අද්දර නිම කිරීමේ ක්‍රමය ඇතුලත් නොවන පිළිතුර වන්නේ,

(i) බඳන යෙදීම, පයිපිං කිරීම, රේන්ද ඇල්ලීම.

(ii) පයිපිං කිරීම, රේන්ද ඇල්ලීම හා ඕවර්ලොක් කිරීම.

(iii) පයිපිං කිරීම, සැන ගාංචු ඇල්ලීම, බ්ලැන්කට් මැස්ම

(iv) පයිපිං කිරීම, දැති කතුරෙන් කැපීම, බ්ලැන්කට් මැස්ම.

(v) සිග්සැග් කිරීම, පයිපිං කිරීම, රේන්ද ඇල්ලීම.

Education NCP - www.edncp.lk

38. උපාංග නිර්මාණයේදී පෝරුව (Lining) යෙදීමෙන් අත්වන වාසියකි,

(i) මැසීමට වැඩි කාලයක් ගත වේ. (ii) සේදීමට පහසුය

(iii) මනා නිමාවක් ලබා නොදෙයි (iv) උපාංගයට ශක්තිමත් බවක් ලබා දෙයි

(v) වැඩි පිරිවැයක් යෙදීමට සිදු වේ

39. මෙම රූප සටහන් වලින් දක්වෙනුයේ පිළිවෙලින්,

දික්කඩ හරස්කඩ





(i) කපු කෙන්දේ දික් කඩ හා කපු කෙන්දේ හරස්කඩ පෙනුම වේ.

(ii) සේද කෙන්දේ දික්කඩ හා ලෝම කෙන්දේ හරස්කඩ පෙනුම වේ.

(iii) නයිලෝන් කෙන්දේ දික්කඩ හා ලෝම කෙන්දේ හරස්කඩ පෙනුම වේ.

(iv) ලිනන් කෙන්දේ දික්කඩ හා ලිනන් කෙන්දේ හරස්කඩ පෙනුම වේ.

(v) ලිනන් කෙන්දේ දික්කඩ හා කපු කෙන්දේ හරස්කඩ පෙනුම වේ.

40. කෙඳි හඳුනා ගැනීම සඳහා ශිෂ්‍යාවක් යම් කෙන්දක් පිළිස්සීමට භාජනය කළාය. ඒ අනුව පහත සඳහන් නිරීක්ෂණ ඇයට ලැබුණි.

- ඉක්මනින් ගිණි අල්ලයි.
- කහ පාටින් ගිණි සිළුවක් ඇත.
- කඩදාසි පිළිස්සෙන ගඳ ඇතිවුණි.
- අළු පැහැති සැහැල්ලු අළු ඉතිරි වෙයි.

මෙම ලක්ෂණ දක්නට ඇත්තේ පහත සඳහන් කුමන කෙඳි වර්ගයේද?

(i) කපු (ii) සේද (iii) රේයෝන් (iv) නයිලෝන් (v) ලෝම

41. කෙඳි වර්ගීකරණයට අනුව කෘතිම කෙඳි ගණයට අයත් වන්නේ,

(i) විස්කෝස්, රේයෝන් (ii) පොලිමයිඩ (නයිලෝන්) (iii) ඇස්බැස්ටස්

(iv) තියුප්‍රා ඇමෝනියම් රේයෝන් (v) ලිනන්

42. සෙරසීන් යනු,

(i) ලෝම කෙඳිවල අඩංගු ප්‍රෝටීන වේ. (ii) කපු කෙඳි වල අඩංගු සෙලියුලෝස් වේ.

(iii) සේද කෙඳිවල අඩංගු මැලියම් සහිත කොටස වේ. (iv) ලිනන් කෙඳිවල අඩංගු සෙලියුලෝස් වේ.

(v) සේද කෙඳිවල අඩංගු ප්‍රෝටීන වේ.

43. පහත සඳහන් මිනුම් අතරින් වක්‍රාකාර මිනුම් පමණක් ඇතුලත් නිවැරදි පිළිතුර වන්නේ,

(i) උරහිස් පළල මිනුම හා පපු මිනුම වේ. (ii) ගෙල වටා මිනුම හා පෙර මැද මිනුම වේ.

(iii) අංශ උස මිනුම හා ආර උස මිනුම වේ. (iv) අත් කට වටා මිනුම හා ඉන මිනුම වේ.

(v) ආර අතර පළල මිනුම හා අත් අග මිනුම වේ.

Education NCP - www.edncp.lk

44. සාරි හැට්ටයේ ඉදිරිපස ඉන මිනුම ගණනය කිරීම නිවැරදිව දැක්වෙනුයේ,

(i) $\left(\frac{\text{ඉන මිනුම} - 5 + 1.5}{2}\right) \div 2$

(ii) $\left(\frac{\text{ඉන මිනුම} + 1.5}{2}\right) + 1.5 \div 2$

(iii) $\left(\frac{\text{ඉන මිනුම} + 1.5}{2}\right) \div 2$

(iv) $\left(\frac{\text{ඉන මිනුම} - 1.5}{2}\right) \div 2$

(v) $\left(\frac{\text{ඉන මිනුම} + 0.5}{5}\right) \div 2$

45. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන පරිදි යොවුන් අවධියට අයත් කාල සීමාව වනුයේ,

(i) අවු : 10 - 15 (ii) අවු : 10 - 24 (iii) අවු : 10 - 30

(iv) අවු : 8 - 15 (v) අවු : 10 - 18

46. කළලය අධි රෝපනය වීම, කළලයේ පෝෂණය සඳහා කළල බන්ධනය හා පෙකෙනි වැල සැකසීම ආදී කාර්යයන් සිදු වන්නේ ප්‍රජනක පද්ධතියේ කුමන අවයවය තුළ ද?

(i) පැලෝපීය නාලය (ii) යෝනි මාර්ගය

(iii) ගර්භාෂය (iv) ඩිම්බ කෝෂ

(v) ගැබ් ගෙල

47. ගර්භණී කාල සීමාව ලෙස සාමාන්‍යයෙන් සැලකෙන්නේ,

(i) සති 45 කි (ii) සති 30 කි (iii) සති 38 කි

(iv) සති 40 කි (v) සති 28 කි

48. අලුත ඉපදුනු දරුවෙකු සඳහා ජාතික ප්‍රතිශක්තීකරණ වැඩ සටහනට අනුව MMR එන්නත (ජර්මන් සරම්ප සඳහා) පළමුවරට දෙනු ලබන වයස් සීමාව වනුයේ,

(i) මාස 6 දී (ii) මාස 8 දී (iii) මාස 18 දී

(iv) අවු 3 දී (v) මාස 12 අවසානයේදී

49. ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ අන්තර්ගත ඩිම්බ කෝෂ යුගලයෙන්, එක් ඩිම්බකෝෂයකින් පරිණත ඩිම්බයක් මුදා හරිනු ලබන කාල සීමාව වනුයේ,

(i) දින 56 කට වරකි (ii) දින 20 කට වරකි (iii) දින 14 කට වරකි

(iv) දින 28 කට වරකි (v) දින 42 කට වරකි

50. ඒකාධිපති පවුල් පරිසරයක් තුළ (ආඥාදායක) ජීවත්වන දරුවෙකු තුළ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

(i) අසතුටින් සිටීම. (ii) කුළෑටි බව (iii) බියගුළු බව

(iv) චතුරකම (v) කතා නොකිරීම.

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

තෙවන වාර පරීක්ෂණය - 2017
විෂය - ගෘහ ආර්ථික විද්‍යාව II

පාසලේ නම : ....

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ....

....

කාලය : පැය 03 යි.

I කොටස

❖ **පළමු වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 2 ක් ද ඇතුලුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන්නේ ඉඩකඩ සීමිත නාගරික නිවසක දළ බිම් සැලැස්මකි. මෙම සැලැස්මෙහි දැක්වෙන නිවසෙහි පෙර පාසල් වියේ ගැහැණු දරුවෙකු සහ යොවුන්වියේ පිරිමි දරුවෙකුගෙන් සමන්විත සිව් දෙනෙකුගෙන් යුත් පවුලක් වාසය කරති.



A. විසිත්ත කාමරය B. ප්‍රධාන නිදන කාමරය C. කෑම කාමරය D. නිදන කාමරය
E. මුළුතැන්ගෙය F. නාන කාමරය G. වැසිකිළිය

I ඉහත බිම් සැලසුමෙහි ප්‍රබලතා හා දුබලතා දක්වන්න. (ල 05)

II මෙම බිම් සැලැසුමෙහි රාශිකරණය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ල 05)

III මෙම නිවස සඳහා ගෘහ භාණ්ඩ තෝරීමේදී සැලකිය යුතු කරුණු කවරේද? (ල 05)

IV විසිත්ත කාමරයේ සෝපාව සඳහා රවුම් හැඩතලයකින් යුත් කුෂන් කවරයක් සඳහා යෝග්‍ය මෝස්තරයක් ගොඩනගන්න. (ල 05)

V ඔබ ගොඩ නගන ලද මෝස්තරය සඳහා යොදා ගන්නා මැහුම් ක්‍රම නම් කර එහි වර්ණ සංකලනය ඉදිරිපත් කරන්න. (ල 05)

02. I (a) ජීවන චක්‍රය තුළ දෛනිකව වැඩි ශක්ති ප්‍රමාණයක් අවශ්‍ය අවධි තුනක් සඳහන් කරන්න.

(b) එම එකිනෙක අවධි සඳහා වැඩි ශක්ති ප්‍රමාණය අවශ්‍යය වීමට හේතු දක්වන්න. (ල. 05)

II (a) ශ්‍රී ලංකාව තුළ පවත්නා පෝෂණ ගැටලු 02 නම් කරන්න.

(b) ඒවායින් ගැටළු 02 ක් මග හරවා ගන්නා ක්‍රම සාකච්ඡා කරන්න. (ල. 05)

III බෝ නොවන රෝග ලෙස වර්තමානයේ බහුලව පවතින රෝග 4 ක් නම් කරන්න. (ල. 05)

IV දියවැඩියා රෝගී තත්වයෙන් වැලකීම සඳහා ආහාර රටාවේ සිදු කල යුතු වෙනස්කම් ලියන්න. (ල. 05)

Education NCP - www.edncp.lk

03. I කෙඳි වර්ගීකරණය කර දක්වන්න. (ල 05)

II සාරි හැට්ටය මැසීමේදී අනුගමනය කරන පියවර අනුපිළිවෙලින් ලියන්න. (ල 05)

III කඳෙහි මූලික පතරොම ඇසුරින් සාරි හැට්ටයේ පිටුපස පතරොම නිර්මාණයේදී ආරය ඉවත් කරන අයුරු රූප සටහන් මගින් පෙන්වන්න. (ල 05)

IV (a) විස්කෝස්, රෙයෝන් නිෂ්පාදන ක්‍රියාවලිය ගැලීම් සටහනකින් දක්වන්න.

(b) ළදරු ඇතිරිල්ල ළදරුවාට සුවපහසුව ගෙන දෙන්නක් විය යුතු ය. ළදරු ඇතිරිල්ල නිර්මාණය කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙල විස්තර කරන්න. (ල 05)

04. I ගෘහ සැලසුම් මූලධර්ම 2 ක් සඳහන් කර ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කිරීමෙහිලා එම මූලධර්ම ඉවහල් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 05)

II කොම්පෝස්ට් සකස් කිරීමේ ක්‍රම කීයද? ඉන් එක් ක්‍රමයක් පැහැදිලි කරන්න. (ල. 05)

III යාන්ත්‍රික නිවාමන් 03ක් නම් කර එයින් එකක් පැහැදිලි කරන්න. (ල. 05)

IV මැහුම් ක්‍රම වර්ගීකරණය කර විසිතුරු මැහුම් ක්‍රම 02 ක් මසන ආකාරය ඇඳ පෙන්වන්න. (ල. 05)

II කොටස

❖ **උපදෙස් : පස්වන ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.**

05. 12 ශ්‍රේණියේ ඉගෙනුම ලබන නිපුනි සඳුදා උදෑසන රැස්වීම ඇමතීම සඳහා අවස්ථාවක් ලබාගෙන තිබුණි. ඇයගේ අරමුණ වී තිබුනේ තම පාසලේ සහෝදර සහෝදරියන් සඳහා තමා ගෘහ ආර්ථික විද්‍යා විෂය තුළින් ලබා ගත් දැනුමෙන් කොටසක් බෙදා හදා ගැනීමටය. එහිදී ඇය පෝෂණය, දරුවන්ගේ සෞඛ්‍ය තත්වය නංවා ලීමට කළ යුතු දේ, වැඩ ලෝකයට සිසුනට යොමු විය හැකි ආකාරය, හා යොවුන් වියේ දරුවන් සමාජයේ කටයුතු කළ යුතු ආකාරය ආදී කරුණු රාශියක් කෙටියෙන් ඉදිරිපත් කළාය.

I වැරදි ආහාර පරිභෝජනය තුලින් සිසුන් මුහුණ දෙන අහිතකර ප්‍රතිඵල 5 ක් ලියන්න. (ල. 05)

II දරුවන්ගේ සෞඛ්‍ය තත්වය නැංවීමට අනුගමනය කළ යුතු කරුණු 5 ක් ලියන්න. (ල. 05)

III යොවුන් දරුවන් පාසලේදී ගැටුම් ඇතිකර ගැනීමට හේතු විමසන්න. (ල. 05)

IV වැඩ ලෝකයට සිසුන් යොමු කිරීම සඳහා ඇය විසින් යෝජනා කරන ලද කරුණු 5ක් ලියන්න. (ල. 05)

V පසු ළමා වියේ දරුවන් සඳහා පාසලට රැගෙන ඒම සඳහා සුදුසු පෝෂණ අගයෙන් යුතු දිවා ආහාර වේලක් සැලසුම් කරන්න. (ල. 05)

06. I නව යෞවන අවධියේ ඇතිවන ප්‍රාථමික ලිංගික ලක්ෂණ හා ද්විතීයික ලිංගික ලක්ෂණ යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ල. 05)

II දරුවෙකුගේ චාලක වර්ධනයට රුකුලක් ලබා දීමට කටයුතු කළ යුතු අයුරු පහදන්න. (ල. 05)

III ගර්භණීභාවයේ ලක්ෂණ 5 ක් ලියන්න. (ල. 05)

IV ගර්භණී මවක් මාතෘ සායනයකට සහභාගී වීම නිසා ලැබෙන වාසි 5 ක් ලියන්න. (ල. 05)

07. I පූර්ව ප්‍රසව අවධිය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ල. 05)

II ගර්භණී මවක් ප්‍රසූතිය සඳහා මුහුණ දීමේදී ඇය කටයුතු කළයුතු ආකාරය විමසන්න. (ල. 05)

III (a) නිවසෙහි ආහාර සකස් කිරීමේදි ඒවායේ සුරක්ෂිතබව රැකගැනිම සඳහා ගන්නා ක්‍රියාමාර්ග 05 ක් පැහැදිලි කරන්න.

(b) පෙර පාසල් දරුවෙකුට රැගෙන යාම සඳහා දිවා ආහාර වේලකට බොජුන් පතක් සැලසුම් කරන්න. (ල. 05)

Education NCP - www.edncp.lk

08. I ආහාර සරු කිරීම හා ප්‍රබල කිරීම කෙටියෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 05)

II ආහාර පරිපූර්ණය හා ආහාර ආකලන භාවිතය පැහැදිලි කරන්න. (ල. 05)

III තෛලෝදකරණය යනු කුමක්ද? පැහැදිලි කර උදාහරණ ලියන්න. (ල. 05)

IV ආහාර සකස් කිරීමේදී සිදුවන දුඹුරු පැහැ ගැන්වීමේ ක්‍රියාවලිය විස්තර කරන්න. (ල. 05)

09. පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

(a) ජීවාණුහරණය හා පැස්චරීකරණය (ල. 05)

(b) පෝෂණමය නීරක්තිය හා පෝෂණමය නොවන නීරක්තිය (ල. 05)

(c) පැසීම හා පිපීම (ල. 05)

(d) ජල ද්‍රාවී තන්තු හා ජල අද්‍රාවී තන්තු (ල. 05)

Education NCP - www.edncp.lk